(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 59]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 ජනවාරි මස 06 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0283/'08

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0590/'08

2.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර රෝහල පිටුපස පිහිටි පොන්නාරායන් කුලම් වැව අවට රජයට අයත් භූමි භාගය අනවසරයෙන් හා බලහත්කාරයෙන් කිසියම් පිරිසක් විසින් අත්පත් කර ගෙන ඇතිබව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අනවසරයෙන් අත්පත් කරගත් කොටස රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කටයුතු සඳහා යෝජිත කොටසක් ලෙස පැවතියේද;

(ii) මෙම අනවසර, බලහත්කාරී අත්පත් කර ගැනීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0604/'08

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) දැයට කිරුළ 2008 ප්‍රදර්ශනය වෙනුවෙන් පළාත් සභාවලට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සහභාගී වූයේද;

(ii) පළාත් සභා සහභාගීවූයේ නම්, එක් එක් පළාත් සභාව වෙන් වෙන් වශයෙන් කවර කටයුතුවල නිරතවීද;

(iii) එකී පළාත් සභා මගින් ප්‍රදර්ශන කුටි හෝ ප්‍රදර්ශන උපකරණ සපයන ලද්දේද;

(iv) එසේ නම්, එම එක් එක් පළාත් සභාව වෙන වෙනම කවර ප්‍රදර්ශන කාර්යයක නිරතවීද;

(v) එක් එක් පළාත් සභාවේ අමාත්‍යාංශ හෝ ආයතන මගින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටි සහ වැය කළ මුදල කොපමණද;

(vi) එම මුදල් වැය කරන ලද ආයතන හා අදාළ වැය ශීර්ෂය කවරේද;

(vii) සියලුම පළාත් සභා මගින් එම ප්‍රදර්ශනය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0551/'08

4.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ඉදිරි දිනයකදී දෙමළ ජනතා විමුක්ති කොටි (ටී. එම්.වී.පී.) පක්ෂය විසින් සැබෑ ලෙසම ආයුධ භාරදීම සම්බන්ධ එකඟතාවකට පැමිණීම පිණිස රජය ජාතික රහස් තොරතුරු කාර්යාංශය (එන්. අයි. බී.) වෙතින් ටී. එම්. වී. පී. පක්ෂයේ පුහුණු සාමාජික සංඛ්‍යාව සහ එය සතු ආයුධ සංඛ්‍යාව පිළිබඳ රහස් තොරතුරු තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(ii) තමන් භාවිතා කරන ආයුධවල ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙස ටී. එම්. වී. පී. පක්ෂයෙන් ඉල්ලීමට රජය තුළ යම් අපේක්ෂාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටී. එම්. වී. පී. පක්ෂය විසින් භාවිතා කෙරෙන ආයුධ ඉවත්කිරීම සම්බන්ධ කටයුතු කිරීමට රජය අපේක්ෂා කරන්නේ කවර දිනයක සිටද;

(ii) නොඑසේ නම්, සෑම පුහුණු සාමාජිකයෙකුගේම නම හා/හෝ ලිපිනය සහ ඔවුන් විසින් භාවිතා කරනු ලබන ආයුධවල විස්තරයක් සහිතව (ආරක්ෂක හේතු නිසා නම් සඳහන් කිරීමෙන් වැළකී සිටිය හැක) මෙම ආයුධ ලියාපදිංචි කිරීමේ සැලසුමක් රජය සතුව තිබේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0552/'08

5.

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජතෙල් සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් නිපදවනු ලබන හෝ ආනයනය කරනු ලබන හෝ සියලුම නිෂ්පාදන වර්ග කවරේද;

(ii) එකී සෑම නිෂ්පාදනයකම විකුණුම් මිලෙන් ලාභය අඩුකළ විට ලැබෙන අගය කවරේද සහ පිරිවැය සංයුතිය විභේදනය වී ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස පිරිවැය ගණනය කිරීමේදී පහත දක්වා ඇති ආකාරයෙන් එහි සෑම අදියරකදීම එකතුවන බදු මුදල කොපමණද;

| | | |
|---|---|---|
| විකුණුම් මිල | | xxxxx |
| නිෂ්පාදන පිරිවැය | xxxx | |
| පරිපාලන පිරිවැය | xxxx | |
| අලෙවිකරණ පිරිවැය | xxxx | |
| මූල්‍ය පිරිවැය | xxxx | |
| වෙළෙඳ දැන්වීම් පිරිවැය | xxxx | xxxxx |
| දළ ලාභය | | xxxxx |
| අඩුකළා: බදු | xxxx | |
| (ඉහත වෙන් වෙන්ව දක්වා ඇති ආකාරයෙන් සියලු බදු වර්ග) | | xxxxx |
| ශුද්ධ ලාභය | | xxxxx |

(ii) පසුගිය වසර 15ක කාලය තුළ ඛනිජ තෙල් සංස්ථාව සහ එහි පාලිත සමාගම් විසින් ඉපැයූ ලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) (i) මෙතෙක් රුපියල් බවට මාරු කර නොමැති, ඩොලර් ලෙස බැංකු වලින් ලබාගෙන ඇති සමස්ත ණය මුදල කොපමණද;

(ii) මෙම විනිමය හුවමාරුවේදී සිදුවී ඇති පාඩුව දරන්නේ කවරෙක්ද;

(iii) ඉහත අ (i) හි සඳහන් පරිදි විකිණූ සමස්ත නිෂ්පාදන ප්‍රමාණයත් එහි සමස්ත මූල්‍යමය වටිනාකමත් කොපමණද;

යන්න එතුමා තවදුරටත් ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0556/'08

6\.
ගරු රවි කරුණානායක මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිරිබත්ගොඩ ගුවන් පාලම ඉදිකිරීමට ගිය වියදම (පිරිවැය) කොපමණද;

(ii) එම ගුවන් පාලමේ දිග සහ මුළු වර්ගඵලය වර්ග මීටර් කොපමණද;

(iii) එම ගුවන් පාලම සාමාන්‍ය පරිදි සිමෙන්ති යොදාගෙන සාදා නිමකළේ නම් දැරීමට සිදුවිය හැකිව තිබූ වියදම කොපමණද;

(iv) මෙම ගුවන් පාලම ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(v) ටෙන්ඩර් කැඳවා තිබේනම් ඉදිරිපත් කළ තරඟකාරී මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගුවන් පාලම ඉදිකිරීම සඳහා අරමුදල් ලැබුණු මූලාශ්‍රය කවරේද;

(ii) වැය වූ සමස්ත පිරිවැය සහ එම ණය මුදලට ගෙවිය යුතු පොළිය කොපමණද;

(iii) එකී ණය මුදල ආපසු ගෙවිය යුතු කාල සීමාව කුමක්ද;

(iv) ඉදිරියේදී ඉදි කිරීමට නියමිත මෙවැනි ගුවන් පාලම් සංඛ්‍යාව සහ ඒවා ඉදිකරනු ලබන ස්ථානයන් කවරේද;

(v) එම එක් එක් පාලමේ පිරිවැය, සමස්ත පිරිවැය සහ ඒවාට අරමුදල් ලැබෙන පදනම කවරේද;

(vi) දේශීය නියෝජිත ආයතනයන් කවරේද සහ ඒවාට ගෙවනු ලබන කොමිස් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0600/'08

7.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් 2007 වසරේ නිකුත්කළ සිංහල සාහිත්‍ය සංග්‍රහය 10, 11 වසර සඳහා නිර්දේශිත පෙළපොතේ ඇතුළත් කුඩලිගම කවියාගේ "වැස්ස" නම් කවි පෙළේ පළමු කවිය ඉවත් කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(ii) එම ග්‍රන්ථයේම අරිසෙන් අහුබුදු ශූරීන්ගේ මගුල් ගීය නම් කවිපෙළක් උපුටා දක්වතත් එහි කවියාගේ නම සඳහන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ග්‍රන්ථයේ ඇතැම් කවිවල අර්ථ විකෘතිකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙවැනි අධ්‍යාපන පෙළපොත් වල සිදුවී ඇති වැරදි නිවැරදි කිරීමට පියවර ගන්නේද;

(ii) එම වැරදිවලට වගකිවයුත්තන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0752/'08

8.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ජාතිය ගොඩනැඟීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2004, 2005, 2006 සහ 2007 වර්ෂවල සමෘද්ධිලාභීන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂ තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිටි එහෙත් පසුව ඉන් ඉවත් කරන ලද සංඛ්‍යාව සහ එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද්දේ කවර පදනමක් යටතේද;

(iii) අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම් එම අයට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0769/'08

9.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල නියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) නියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0779/'08

10. ගරු තිලකරත්න විතානාච්චි මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බද්දේගම, ගිණිමැල්ලගහ පිහිටි "වාන්ට් ලංකා කන්පැක්ෂනරීස්" ආයතනය දේශීය කර්මාන්ත ශාලාවක් ලෙස විශාල පිරිසකට රැකියා ලබාදෙමින් පවත්වාගෙන යන බවත්;

(ii) තෙකලා විදුලිබලය නොමැති නිසා එම කර්මාන්ත ශාලාවේ ධාරිතාව වැඩි කිරීමට නොහැකි වී ඇති බවත්;

(iii) තෙකලා විදුලිබලය ලබාදෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා සිටියද, මීටර් ගණනාවක දුරෙහි වෙනසක් නිසා මෙතෙක් විදුලිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ නිසා නව විදුලි ට්‍රාන්ස්ෆෝමරයක් සවිකර විදුලිය ලබා ගැනීමට සිදුවී ඇති බව අදාළ අමාත්‍යාංශයට වාර්තා වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පවතින නිෂ්පාදන වියදම් අධිකවීම නිසා එවැනි විශාල මුදලක් එකවර ආයෝජනය කිරීමට නොහැකි බවත්;

(ii) දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීමේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ මෙම කර්මාන්ත ශාලාවට විදුලිය උප පොළක් ලබාදෙන්නේ නම් තවත් විශාල පිරිසකට රැකියා ලබාදීමට හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම තත්වය සැලකිල්ලට ගෙන දේශීය කර්මාන්ත රැක ගැනීමේ සහ වැඩි දියුණු කිරීමේ වැඩ පිළිවෙළ යටතේ නව විදුලි උප පොළක් පිහිටුවීමට වැය වන මුදලින් කොටසක් හෝ ලබාදීමට ඇති හැකියාව සොයා බලා කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0773/'08

11.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික්ක මායිම් දෙපස පිහිටා ඇති "හල්මිල්ල දෙමඩ" රක්ෂිතයට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ 431/ඒ, ගොම්බාව ග්‍රාම නිලධාරි වසමේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ 411 ඉම්හාමින්නේගම ග්‍රාම නිලධාරි වසමේ දිස්ත්‍රික් මායිම් දෙපස පිහිටි රක්ෂිතයේ කොටස් නිරූපණයේදී, ඉම්හාමින්නේගම ග්‍රාම නිලධාරී වසමේ පුද්ගලික (සින්නක්කර) ඉඩම් පවා රක්ෂිතය තුළට ගෙන නිරූපණය කර ඇතත්, "හල්මිල්ල දෙමඩ" රක්ෂිතයේ පී. ඩී. කාන්ති මීගොඩ යන අය භුක්තිවිඳින ඉඩම රක්ෂිතයට ඇතුළත් නොවන සේ නිරූපණය කර ඇති බවත්;

(ii) ඉම්හාමින්නේගම "පුබුදු" ග්‍රාම සංවර්ධන සමිතියට ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රජා ජල ව්‍යාපෘතියක් සඳහා රු. 1,048,044.00ක මුදලක් ලැබී තිබුනද, ඒ සඳහා "හල්මිල්ල දෙමඩ" ඇල ආශ්‍රිත භූමියට යාමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකගේ "වාර්ෂික විවිධ අවසර පත්‍රයක්" ලබාගෙන තිබියදීත් පෙර භුක්තිකාරිය ඊට බාධා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත භුක්තිකාරිය හා ඇගේ සහායකයින් විසින් ඇතිකරන බාධාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) රක්ෂිතය නිරූපණයේදී සිදුවූ ඌණතා මගහරිමින් නැවත රක්ෂිතය සලකුණු කිරීමට කටයුතු කරන්නේද;

(iii) රක්ෂිතය විනාශ කරමින් එය තම ග්‍රහනයට ගැනීමට කටයුතු කළ අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0863/'08

12.

ගරු ජේමසිරි මානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාසල් පද්ධතිය තුළ ධීවර විෂය හදාරන ශිෂ්‍යයින් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල් පද්ධතිය තුළ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ධීවර විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විෂය ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය සඳහා ධීවර විෂයට අදාළව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත පෙළපොත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0866/'08

13.

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කච්චතිව් දූපතේ විශාලත්වය කොපමණද;

(ii) එම දූපතේ සම්පූර්ණ ජනගහනය කොපමණද;

(iii) එහි ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉන්දීය රජයට එම දූපතේ අයිතිය නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම දූපත සම්බන්ධයෙන් ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවේ රජයට කරන ලද බලපෑම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0888/'08

14.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගොඩ, ගොඩගම, පැල්පොල වත්තේ, සමාධි මාවත හා කිරිමැට්ට පාර යන ස්ථාන දෙකෙහි ඇතිවී තිබෙන අනතුරු හේතුවෙන් දුම්රිය ආරක්ෂිත ගේට්ටුවක හෝ විදුලි සංඥා ලාම්පුවක අවශ්‍යතාවය හෝමාගම ප්‍රාදේශීය සභාව හා ප්‍රදේශවාසීන් විසින් ලිඛිතව දන්වා ඇති බවත්;

(ii) පිළිතුරු වශයෙන් 2008.04.30 දිනැති ලිපියක් එතුමාටද පිටපතක් සහිතව දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත එවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දුම්රිය මාර්ගය හරහා ඇති හරස් මාර්ගවල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව සැපයීමට දුම්රිය දෙපාර්තමේන්තුවට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවට එම ලිපියේ 2 වැනි ඡේදයේ සඳහන් බවටත්;

(ii) 3 වැනි ඡේදයේ, හරස් මාර්ග ඔස්සේ ගමන් ගන්නා වාහන ධාවකයන්ට ආරක්ෂාව සැපයීමට දුම්රිය දෙපාර්තමේන්තුවට වගකීමක් නැති බවටත්;

(iii) 4 වැනි ඡේදයේ, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවටත්;

සඳහන් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ ලිපියේ සඳහන් පරිදි හරස් මාර්ගවල ගමන් ගන්නා මගීන්ගේ හා වාහනවල ආරක්ෂාව ගැන නොසැලකීමට ප්‍රතිපත්තිමය තීරණය ගන්නා ලද්දේ කවදාද;

(ii) තීරණය ගැනීමට සහභාගි වූ අය කවුරුන්ද;

(iii) එම තීරණය පොදු මහජනතාවට දැනුම් දීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— රණවිරු සේවා අධිකාරි (සංශෝධන),— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම් දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

4.

ගරු අර්ජුන රණතුංග මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" මහින්දානන්ද අළුත්ගමගේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 ජනවාරි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

ජාතිය ගොඩනැඟීමේ බදු පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*3.

සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*4.

ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*5.

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| උප සභාපති | | | | |
| වැටුප | - | රු. | 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 12.000.00 | මාසික |
| | එකතුව | රු. | 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*16.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*19.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*20.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*21.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*22.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*23.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*24.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*25.

පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/-<br>රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 02 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 02 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "පුපුරන ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම" ශ්‍රී ලංකා නාවික හමුදාව දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 345,000,000<br>420,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 200,000,000<br>275,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.11.05 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරිම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*33.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*34.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

35.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0234/'08

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— තරුණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) තරුණ කටයුතු (කැබිනට්) අමාත්‍යතුමිය සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0236/'08

2.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් හා විදුලි සංදේශ (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0246/'08

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආපදා සහන සේවා (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0250/'08

4.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහාමාර්ග (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0267/'08

5\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පේෂකර්මාන්ත සංවර්ධන (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0269/'08

6\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය ආදායම් හා මුදල් (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0284/'08

7.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0285/'08

8.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0286/'08

9.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු යටිතල පහසුකම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0287/'08

10.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0288/'08

11.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0289/'08

12.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0770/'08

13.
ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල යක්කලමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) යක්කලමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0771/'08

14.
ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල තවලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) තවලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?